## බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු තනතුර සඳහා අදාළ වන පළමුවන, දෙවන හා තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය - 2020

බස්නාහිර පළාත් සෞඛ්‍ය සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ, පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සහ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු තනතුරට අදාළ වන පළමුවන, දෙවන හා තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ 2020 වර්ෂය සඳහා පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. එම පරීක්ෂණය පවත්වනු ලබන ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**01. සුදුසුකම්**

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අයදුම්කල හැක්කේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු තනතුරේ III ශ්‍රේණියේ මෙතෙක් මෙම පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති සේවක මහත්ම මහත්මීන්ට පමණි.

දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අයදුම්කල හැක්කේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු තනතුරේ II ශ්‍රේණියේ මෙතෙක් මෙම පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති සේවක මහත්ම මහත්මීන්ට පමණි.

තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අයදුම්කල හැක්කේ බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ඒකාබද්ධ රියදුරු තනතුරේ I ශ්‍රේණියේ මෙතෙක් මෙම පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති සේවක මහත්ම මහත්මීන්ට පමණි.

තවද අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2020.03.02 වන විට අදාළ ශ්‍රේණියට පත්කර, අදාළ පත්වීම් ලිපිය ලබා ඇති සේවක මහත්ම මහත්මීන්ගේ අයදුම්පත් පමණක් මා වෙත එවීමට කටයුතු කරන්න.

**02. අයදුම්පත්**

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කර ගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා හා දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2020.03.02 දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය. ඒ සමග අදාළ ශ්‍රේණියට පත්කළ/ අන්තර්ග්‍රහණය කල ලිපියේ පිටපතක් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ද නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැ.යු. ආදර්ශ අයදුම්පතෙහි ආකෘතිය අනුව, අයදුම්පත්‍රය එකම කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පළමු පිටුවේ අංක 01 සිට 08 දක්වාත් දෙවන පිටුවේ අංක 09 සිට 11 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියළුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**03. පරීක්ෂණයට ඇතුලත් කර ගැනීම.**

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත්‍ර නියමිත පරිදි සම්පූර්ණ කර සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙර ස්වකීය අනන්‍යතාවය තහවුරු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය
(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය